සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**84 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)**
**General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)**

**ශිල්ප කලා I, II**
நுண்கலை I, II
Arts and Crafts I, II

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ශිල්ප කලා I


**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ශ්‍රී ලාංකේය ජනකලාවන් සුරැකීම සඳහා රජය විසින් ගෙන ඇති වඩාත් ඵලදායී ක්‍රියා මාර්ගයක් වන්නේ,
(1) ජනකලාවන් පිළිබඳ දැනුවත් කිරීමේ පුවරු සෑම නගරයක ම ප්‍රදර්ශනය කිරීම ය.
(2) ජනකලා නිර්මාණ සඳහා ජනපද පිහිටුවීම ය.
(3) ජනකලා ශිල්පීන්ට දිරි දීමනා ලබා දීම ය.
(4) ජනකලා ආශ්‍රිත සියලු නිෂ්පාදන රජය විසින් මිලදී ගැනීම හා අලෙවි කිරීම ය.


**2.** ජ්‍යාමිතික උපකරණ කට්ටලයේ ඇති විහිත චතුරස්‍ර යුගලය භාවිත කර නිර්මාණය කළ හැකි ආනත රේඛා ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) 30°, 45°, 60° (2) 30°, 45°, 90°
(3) 45°, 60°, 90° (4) 90°, 180°, 240°

**3.** මෙම රූපයේ දැක්වෙන ජ්‍යාමිතික උපකරණය භාවිත කළ යුතු අවස්ථා නිවැරදිව දැක්වෙන පිළිතුර මින් කුමක් ද?



(1) වෘත්ත ඇඳීමේ දී සහ චාප ඇඳීමේ දී
(2) චාප සලකුණු කිරීමේ දී සහ වක්‍ර රේඛා ඇඳීමේ දී
(3) රේඛාවක් සම කොටස්වලට බෙදීමේ දී සහ මිනුම් පරීක්ෂා කිරීමේ දී.
(4) වක්‍ර රේඛා ඇඳීමේ දී සහ රේඛා කොටස්වලට බෙදීමේ දී

**4.** රූපයේ දැක්වෙන නිර්මාණය ඇඳීම සඳහා භාවිත කර ඇති සම්මත රේඛා විශේෂය වන්නේ,





(1) සරල රේඛා ය. (2) ඝන අඛණ්ඩ රේඛා ය.
(3) සිහින් අඛණ්ඩ රේඛා ය. (4) සිහින් දාම රේඛා ය.

**5.** වෘත්තයක අන්තර්ගත කොටසක් වන වෘත්ත ඛණ්ඩය නිවැරදිව අර්ථ ගන්වා ඇති වැකිය තෝරන්න.
(1) අරයන් දෙකකින් හා ඒ තුළ වූ චාපයෙන් වෙන් වූ කොටස වෘත්ත ඛණ්ඩය ලෙස හැඳින්වේ.
(2) විෂ්කම්භය හා චාප කොටසකින් වෙන් වූ කොටස වෘත්ත ඛණ්ඩය ලෙස හැඳින්වේ.
(3) වෘත්තය සමාන කොටස් හතරකට බෙදා ඉන් එක් කොටසක් වෘත්ත ඛණ්ඩය ලෙස හැඳින්වේ.
(4) චාපයක් හා ජ්‍යායක් අන්තර්ගත වූ කොටස වෘත්ත ඛණ්ඩය ලෙස හැඳින්වේ.

[දෙවැනි පිටුව බලන්න.

**6.** ඉලිප්සයක් නිර්මාණයේ දී නාභීන් ලබා ගැනීමට භාවිත කරන ශිල්පීය ක්‍රමය මින් කුමක් ද?
(1) මහ අක්ෂයේ අඩක් කවකටුවට ගෙන සුළු අක්ෂයේ ඕනෑම කෙළවරක් කේන්ද්‍රය ලෙස ගෙන මහ අක්ෂය දෙපසට ඡේදනය කිරීම
(2) සුළු අක්ෂයේ අඩක් කවකටුවට ගෙන මහ අක්ෂයේ ඕනෑම කෙළවරක් කේන්ද්‍රය ලෙස ගෙන සුළු අක්ෂය දෙපසට ඡේදනය කිරීම
(3) මහ අක්ෂයේ අඩක් කවකටුවට ගෙන නියාමන අක්ෂය දෙපසට ඡේදනය කිරීම
(4) සුළු අක්ෂයේ අඩක් කවකටුවට ගෙන නියාමන අක්ෂයේ කෙළවර තබා දෙපසට ඡේදනය කිරීම

**7.**





රූපයේ පෙන්වා ඇති මහා කෝණී ත්‍රිකෝණයේ ඇති සුවිශේෂිතා ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) $c$ කෝණය $90^{\circ}$ ක් වන අතර $AC$ හා $BC$ පාද දෙක සමාන වේ.
(2) $a$ සහ $b$ කෝණ අසමාන වන අතර $AC$ හා $BC$ පාද සමාන වේ.
(3) $c$ කෝණය $90^{\circ}$ ට වඩා වැඩි වන අතර ඉතිරි කෝණ දෙකේ අගය සමාන වේ.
(4) $c$ කෝණය $90^{\circ}$ ට වඩා වැඩි වන අතර ඉතිරි කෝණ දෙකේ අගය අසමාන වේ.

**8.** එක්තරා තල ජ්‍යාමිතික හැඩතලයක සුවිශේෂී ලක්ෂණ පහත දැක්වේ.
- සම්මුඛ පාද සමාන හා සමාන්තර වේ.
- කෝණ සෘජුකෝණී වේ.
- විකර්ණ දිගින් සමාන වේ.
- විකර්ණ එකිනෙක සමච්ඡේදනය වේ.

එම තල ජ්‍යාමිතික හැඩතලය මින් කුමක් ද?
(1) ත්‍රිකෝණය (2) සමචතුරස්‍රය (3) සෘජුකෝණාස්‍රය (4) ත්‍රිපිසියම

**9.** පංති කාමරයේ දී ඔබ විසින් සකස් කරනු ලැබූ රෙදි පංචාස්‍ර බෝලය සඳහා යොදා ගත් සවිධි පංචාස්‍ර සංඛ්‍යාව කොපමණ ද?
(1) 6 (2) 8 (3) 10 (4) 12

**10.**




ඉහත රූපයේ දැක්වෙන්නේ සවිධි බහු අස්‍ර ඇඳීමේ ක්‍රමවේදයකි. සවිධි පංචාස්‍රයක් නිර්මාණයේ දී පළමුව කළ යුතු වන්නේ,
(1) $CD$ රේඛාව සමාන කොටස් පහකට බෙදීම ය.
(2) $CE$ රේඛාව සමච්ඡේදනය කරගැනීම ය.
(3) $EF$ රේඛා ඛණ්ඩය සමච්ඡේදනය කරගැනීම ය.
(4) $AF$ රේඛා ඛණ්ඩය සමච්ඡේදනය කරගැනීම ය

**11.** පිළි අලංකරණයේ දී භාවිත වන වර්ණ අතුරෙන් මූලික වර්ණයක්, ද්විතියික වර්ණයක් හා තෘතියික වර්ණයක් පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.
(1) රතු, කොළ, දම් (2) කහ, නිල් දම්, රතු තැඹිලි
(3) නිල්, තැඹිලි, රතු දම් (4) කොළ, කහ, කහ කොළ

12. රෙදි පින්තාරු කිරීමේ දී තද පැහැයක් ලා පැහැයක් කර ගැනීමට එක් කළ යුතු වන්නේ,
(1) කළු පැහැති වර්ණයකි. (2) සුදු පැහැති වර්ණයකි.
(3) කහ පැහැති වර්ණයකි. (4) රෝස පැහැති වර්ණයකි.

13. පින්තාරු කිරීමේ දී භාවිත කෙරෙන අංක 4-5 වැනි පින්සල් අවශ්‍ය වන්නේ,
(1) සියුම් රේඛා සහ ඉම් රේඛා දැක්වීමට ය.
(2) විශාල ප්‍රදේශයක් එක්වර පදාස ක්‍රමයට වර්ණ ගැන්වීමට ය.
(3) තරමක් විශාල මල්, ගෙඩි, කොළ වර්ණ ගැන්වීමට ය.
(4) වාටි මෝස්තර ඇඳ දැක්වීමට ය.

14. බතික් නිර්මාණ ක්‍රියාවලියේ දී ඉටිවල පිපිරීම් ප්‍රමාණය අඩුකර ගැනීමට කළ යුතු වන්නේ මිශ්‍රණයේ,
(1) පැරපින් ඉටි ප්‍රමාණය වැඩි කිරීම ය. (2) රට දුම්මල ප්‍රමාණය වැඩි කිරීම ය.
(3) මී ඉටි ප්‍රමාණය වැඩි කිරීම ය. (4) පැරපින් ඉටි ප්‍රමාණය අඩු කිරීම ය.


15. රෙදිපිළි අලංකරණයට පෙර සිදු කෙරෙන ක්‍රියාවලියක් ලෙස පෙර පිරියම් කිරීම සඳහන් කළ හැකි ය. පෙර පිරියම් කිරීමෙන් අපේක්ෂා කෙරෙන්නේ,
(1) නිෂ්පාදිත රෙදිපිළිවලට අවශ්‍ය ශක්තිය ලබාදීමයි.
(2) නිෂ්පාදිත රෙදිපිළි තනි වර්ණයකින් වර්ණ ගැන්වීමයි.
(3) නිෂ්පාදිත රෙදිපිළිවලට බාහිරින් එකතු වන අපද්‍රව්‍ය ඉවත් කරගැනීමයි.
(4) නිෂ්පාදිත රෙදිවල බර ප්‍රමාණය වර්ධනය කරගැනීමයි.


16. ඉහළ වටිනාකමක් සහිත ලිනන් රෙදි වියීම සඳහා කෙඳි ලබා ගන්නා ශාකය වන්නේ,
(1) හණ (Flex) ය. (2) ජුට් (Jute) ය. (3) රමි (Ramie) ය. (4) මැනිලා (Manila) ය.


17. කෙඳි හඳුනා ගැනීමේ පරීක්ෂාවක් වන පිලිස්සුම් පරීක්ෂාවේ දී පිහාටු පිලිස්සෙන ගඳ සහිතව ඉතා කුඩා අළු ගුලි සෑදෙන රෙදි විශේෂ වන්නේ,
(1) ලෝම හා ලිනන් ය. (2) ලිනන් හා කපු ය.
(3) ලෝම හා සේද ය. (4) සේද හා කපු ය.


18. අච්චු මුද්‍රණ ක්‍රියාවලියේ පියවර කිහිපයක් පහතින් දැක්වේ.
*A* - රටාවක් ගොඩනැගෙන සේ මුද්‍රා තබා ගැනීම
*B* - මෝස්තරයක් ඇඳ ගැනීම
*C* - මුද්‍රණ තලයේ රෙදිකඩ සවි කිරීම
*D* - අච්චු මුහුණතේ සායම් ආලේප කිරීම
*E* - කැපුම් තලයක ආධාරයෙන් මෝස්තරය කපා ගැනීම
ඉහත ක්‍රියාවලියේ නිවැරදි අනුපිළිවෙළ ඇතුළත් වරණය තෝරන්න.
(1) *ABCDE* (2) *BECDA* (3) *CDEAB* (4) *DEABC*

19. රෙදි මුද්‍රණය සඳහා සිදුරුපතක් සකස් කිරීමේ දී භාවිත කළ යුතු නිවැරදි රූපය මින් කුමක් ද?


(1)


(2)


(3)


(4)

20. විවිධ අවස්ථාවල දී මැටි භාණ්ඩ අලංකරණය කෙරෙන අතර කැටයම් කැපීම සහ සීරුම් රටා යෙදීම සිදුකරනු ලබන්නේ,
(1) නිෂ්පාදන අවස්ථාවේ දී ය. (2) පළමු පිලිස්සීමෙන් පසු අවස්ථාවේ දී ය.
(3) දෙවන පිලිස්සීමෙන් පසු අවස්ථාවේ දී ය. (4) හම් පදම් අවස්ථාවේ දී ය.

21. ජවනඩා යන්ත්‍රයක වියීමේ දී නූල් විවර හරහා හරස් නූල් යෙදීම මගින් සිදු කෙරෙන වියීම සඳහා නූල් තට්ටු උස්පහත් කර ගැනීමට ආධාර කරන්නේ කුමක් ද?
(1) අළුව (batten) (2) ලීවර (levers) (3) පනාව (reed) (4) පුඩුවැල් (healols)

**22.** පේෂකර්ම තාක්ෂණයේ දී කෙටි කාලයක් තුළ වැඩි නිෂ්පාදන ධාරිතාවක් ලබාගැනීම සඳහා භාවිත කරන විවීමේ යන්ත්‍රය වන්නේ,

(1) මේස යන්ත්‍රය (table loom) ය. (2) යුටිලිටි යන්ත්‍රය (utility loom) ය.
(3) ජවනඩා යන්ත්‍රය (fly shuttle loom) ය. (4) බලවේග යන්ත්‍රය (power loom) ය.

**23.** නූල් හැදයක් සකස් කර ගැනීමේ දී නූල් බෙත්ම භාවිතයෙන් සීරු දැමීම (lease) සිදු කර ගැනේ. සීරු ලැබෙන ලෙස නූල් බෙත්මෙන් නූල් අදිනු ලබන්නේ කෙසේ ද?

(1) සෑම පුඩු ඇස් සිදුරකින් ම එක් නූලක් බැගින් ඇදීමෙනි
(2) පුඩු ඇස් සිදුරු එකක් හැර එකක් ලෙස නූල් ඇදීමෙනි
(3) එක් පුඩු ඇස් සිදුරකින් එක් නූලක් සහ අතරින් එකක් ලෙස ඇදීමෙනි
(4) රටාවට අනුව ගණනය කර ඒ අනුව නූල් ඇදීමෙනි

**24.** මීටර් 60ක් දිග සෙන්ටිමීටර් 30ක් පළල අත්පිස්නා හැදයක් සෙන්ටිමීටරයකට දික් නූල් 20ක් යොදා සකස් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම හැදයට අවශ්‍ය දික් නූල් සංඛ්‍යාව වන්නේ,

(1) $30 \times 20 = 600$ (2) $60 \times 20 = 1200$ (3) $60 \times 30 = 1800$ (4) $60 \times 30 \times 20 = 36000$

**25.** දිග මීටර් 100ක් සහ පළල සෙන්ටිමීටර් 50ක් වන සෙන්ටිමීටරයකට දික් නූල් 30ක් ඇති හැදයක් දැමීමට අවශ්‍ය දික් නූල් සංඛ්‍යාවේ දිග වන්නේ කිලෝමීටර්

(1) $50 \times 30 \times 2 = 3000$ කි. (2) $100 \times 50 \times 2 = 10000$ කි.
(3) $840 \times 100 = 84000$ කි. (4) $100 \times 50 \times 30 = 150000$ කි.

**26.** හැදයක් දැමීම සඳහා මෙට්‍රික් අංක $2/40^{s}$ නූල් කිලෝ ග්‍රෑම් 5ක් භාවිත කර ඇත. එහි අඩංගු නූල් කැරළි සංඛ්‍යාව,


(1) 20 කි. (2) 40 කි. (3) 100 කි. (4) 120 කි.

**27.** දිග මීටර් 100ක් සහ පළල සෙන්ටිමීටර් 50ක් වන හැදයක් සඳහා සෙන්ටිමීටරයකට නූල් 48ක් යොදා අංක $2/60^{s}$ නූලෙන් විවීමට අදහස් කර ඇත. ඒ සඳහා වැය වන නූල්වල බර කොපමණ ද?

(1) $\frac{100 \times 50 \times 48 \times 2}{1000 \times 60} = 8$ kg (2) $\frac{1000 \times 50 \times 2}{100 \times 60} = 100$ kg


(3) $\frac{1000 \times 48 \times 50}{100 \times 60 \times 2} = 200$ kg (4) $\frac{1000 \times 60 \times 48}{100 \times 50 \times 2} = 288$ kg

**28.** චාම් වියමන් ප්‍රභේදයේ දික්හරස් නූල් දෙකක් හෝ වැඩි ගණනක් සමානව බැඳීමෙන් මතුවන හැඩතලය වන ජටා වියමන (Mat weave) පහත වියමන් රටා අතරින් තෝරන්න.



(1) (2) (3) (4)

**29.** පහත දැක්වෙන වියමන් රටා පිළිවෙළින් නිවැරදිව නම් කර ඇති වරණය තෝරන්න.



(a) (b) (c) (d)

(1) දඟර හීරි, සරල හීරි, රැවිත හීරි, තුඩු හීරි
(2) සරල හීරි, රැවිත හීරි, තුඩු හීරි, දඟර හීරි
(3) රැවිත හීරි, තුඩු හීරි, දඟර හීරි, සරල හීරි
(4) තුඩු හීරි, දඟර හීරි, සරල හීරි, රැවිත හීරි

**30.** බඳුන් පලස් හැදයක් විවීම සඳහා නූල් කිලෝග්‍රෑම් 4ක් වැය වූ අතර එහි දෙපට නූල් කැරළි 80ක් අඩංගු වී තිබුණි. එම නූලේ අංකය මින් කුමක් ද?

(1) $2/40^s$ (2) $2/60^s$ (3) $2/80^s$ (4) $80^s$

**31.** මැටි භාණ්ඩ නිෂ්පාදනයේ දී ප්‍රාථමික මැටි හෙවත් පිහිටි මැටි භාවිතයෙන් කරන නිෂ්පාදන වන්නේ,

(1) උළු, ගඩොල් සහ විසිතුරු භාණ්ඩ ය. (2) බිම් ගඩොල්, මල් බඳුන් සහ වළං ය.
(3) පෝසිලේන් භාණ්ඩ, දන්තාලේප සහ පුයර ය. (4) ගිනිගල්, පෝරණු උපාංග සහ ආවරක පෙට්ටි ය.

**32.** රසායනික ජල අණු දෙකක් සහ යකඩ ඉතා කුඩා ප්‍රතිශතයක් අඩංගු වන පිඟන් භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස සැලකෙන ඇලෙනසුළු අමුද්‍රව්‍යයක් වන්නේ,

(1) කෙඔලින් ය. (Kaolin) (2) ෆෙල්ස්ෆාර් ය. (Feldspar)
(3) ඩොලමයිට් ය. (Dolamite) (4) බෙන්ටොනයිට් ය. (Bentonite)

**33.** විවිධ නිෂ්පාදන සඳහා භාවිත කෙරෙන මැටි වර්ග එක් එක් ප්‍රදේශවල නිධි වශයෙන් පිහිටා තිබේ. තෙත් කලාපීය කෙඔලින් මැටි නිධි පිහිටා ඇත්තේ,

(1) දෙදියවල සහ පිළියන්දල ය. (2) බොරලැස්ගමුව සහ මීටියාගොඩ ය.
(3) කැළණිය සහ බියගම ය. (4) මොලගොඩ සහ දේවාලෙගම ය.

**34.** මැටි භාණ්ඩ නිෂ්පාදනයේ දී මැටිවල භෞතික හා රසායනික ගුණ පිළිබඳ දැන සිටීම අනිවාර්ය වේ. භාණ්ඩයක නියමිත හැඩය පවත්වා ගැනීමට බලපාන ප්‍රධාන සාධකය වන්නේ,

(1) සමබරතාවයි. (2) වර්ණයයි.
(3) හැකිළීමයි. (4) සුවිකාර්යතාවයි.


**35.** මැටි භාණ්ඩ පිලිස්සීම අවස්ථා දෙකක දී ම සිදුවන අතර පළමු පිලිස්සීම (Bisquit firing) පමණක් ප්‍රමාණවත් භාණ්ඩ කාණ්ඩය වන්නේ මින් කුමක් ද?

(1) පිඟන්, කෝප්ප, පීරිසි සහ ජෝගු
(2) සනීපාරක්ෂක භාණ්ඩ, මුහුණු දොවන බේසම් (sinks), ජෝගු
(3) වළං, ගුරුලේත්තු, උළු ගඩොල්
(4) ගිනි ගඩොල්, ගිනි කොත්, සැගර පෙට්ටි

**36.** මැටි භාණ්ඩ පිලිස්සීම සඳහා ග්‍රාමීය පරිසරවල බහුලව භාවිතවන දේශීය පෝරණුවක පවත්වා ගත හැකි උපරිම උෂ්ණත්ව පරාසය වන්නේ,

(1) 850 ℃ - 900 ℃ ය. (2) 900 ℃ - 950 ℃ ය.
(3) 950 ℃ - 1000 ℃ ය. (4) 1000 ℃ - 1050 ℃ ය.

**37.** රූපයේ දැක්වෙන හැඩය සහිත සෙරමික් භාණ්ඩ නිර්මාණය කිරීමට භාවිත කර ඇති ශිල්පීය ක්‍රමය වන්නේ,



(1) අච්චු ක්‍රමයයි.
(2) සකපෝරුවේ ඉදිකිරීමයි.
(3) මැටි දරණු ක්‍රමයයි.
(4) මැටි තහඩු ක්‍රමයයි.

**38.** මාබල් රටා ක්‍රමයට මැටි භාණ්ඩයක් අලංකාර කිරීමේ දී ජල බඳුන මතට යොදන සායම් වර්ගය වනුයේ,

(1) දිය සායම් ය. (2) පෝස්ටර් සායම් ය.
(3) ෆැබ්රික් සායම් ය. (4) තෙල් සායම් ය.

**39.** පිලිස්සීම සඳහා භාවිතයට ගැනෙන උෂ්ණත්ව ප්‍රමාණය අනුව මැටි භාණ්ඩ වර්ග කෙරේ. පහත ඒවා අතරින් ඉහළ ම උෂ්ණත්වයක් අවශ්‍ය වන්නේ කුමන භාණ්ඩ පිලිස්සීම සඳහා ද?

(1) අර්දන් වෙයා (2) පෝසිලේන් (3) ස්ටෝන් වෙයා (4) රතු මැටි භාණ්ඩ

**40.** මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා ක්‍රම රාශියක් භාවිත කෙරේ. එකම හැඩයේ භාණ්ඩ රාශියක් අවශ්‍ය අවස්ථාවල වඩාත් ඵලදායී නිෂ්පාදන ක්‍රමය වන්නේ,

(1) සකපෝරු භාවිතයයි. (2) අච්චු ක්‍රමය භාවිතයයි.
(3) මැටි දරණු ක්‍රමය භාවිතයයි. (4) මැටි තහඩු ක්‍රමය භාවිතයයි.

* *

[හයවැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**84 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023 (2024)

**ශිල්ප කලා I, II**
நுண்கலை I, II
Arts and Crafts I, II

## ශිල්ප කලා II

✻ **පළමුවැනි** ප්‍රශ්නය ද තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** ඔබ පාසලේ මෙවර පැවැත්වෙන නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවයේ විසිතුරු කිරීමේ අවස්ථා සියල්ල ශිල්ප කලා අංශයේ සිසුනට පැවරීමට ක්‍රීඩා කමිටුව තීරණය කර ඇත.

(i) ක්‍රීඩා උත්සවය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමට සුදුසු පෝස්ටරයක ආකෘතියක් ඇඳ දක්වන්න.

(ii) ආරාධිතයන් සඳහා යැවීමට ආරාධනා පත්‍රයක මුහුණතකට සුදුසු චිත්‍රයක් ඇඳ දක්වන්න.

(iii) වියමන් රටා ඇසුරින් නිවාස නාම සකස් කිරීමට යොදා ගත හැකි පන් වර්ග **දෙකක්** නම් කරන්න.

(iv) සමාරම්භක උළෙලේ නිවාස පුවරු රැගෙන යන ශිෂ්‍යයින්ගේ ඇඳුම් අලංකාර කිරීම සඳහා අච්චු මුද්‍රණ ක්‍රමයෙන් සකස් කර ගත හැකි මෝස්තරයක් චිත්‍රණය කර දක්වන්න.

(v) 'පරවි' නිවාසයේ සිසුන් හඳුනා ගැනීම සඳහා පැළඳීමට සුදුසු ලාංඡනයක රූප සටහනක් ඇඳ දක්වන්න.

(vi) සහතික පිරිනමන අවස්ථාවේ ක්‍රීඩකයින්ට දීමට යොදා ගන්නා, කෘත්‍රිම මල් සැකසුම් භාවිතයේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

(vii) විවේක කාලයේ දී නිවාස සාමාජිකයින්ට ලබා දෙන කෙටි ආහාරය අසුරාලීමට සුදුසු ඇසුරුමක රූපීය පෙනුම ඇඳ දක්වන්න.

(viii) තූර්ය වාදක කණ්ඩායමේ සාමාජිකයින්ට ගෙළ පැළඳීම සඳහා ආභරණ සැකසීමට යොදා ගත හැකි ස්වභාවික ඇට වර්ග **දෙකක්** ලියන්න.

(ix) නිවාස ධජයක් ඩිජිටල් මුද්‍රණය සඳහා රුපියල් අටසියයක් වැය වන අතර ධජ පහක් මුද්‍රණයේ දී 20% ක වට්ටමක් හිමි වේ. නිවාස ධජ පහ මුද්‍රණයට වැය වන මුදල ගණනය කරන්න.


(x) දක්ෂතම ක්‍රීඩකයින්ට/ක්‍රීඩිකාවන්ට පිරිනමන කුසලානය සඳහා සුදුසු ආකෘතියක් චිත්‍රණය කර දක්වන්න.

**2.** භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේ දී සැලසුම් චිත්‍ර නිර්මාණයට ජ්‍යාමිතිය හා යාන්ත්‍රික ඇඳීම භාවිතයට ගනු ලබයි.

(i) කවකටුව හා කෝදුව භාවිතයෙන් පාදයක් 4 cm වූ ABC සමපාද ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

(ii) 7 cm වූ AB රේඛාව ඇඳ A සිට 4 cm ක් දුරින් පිහිටි ලක්ෂ්‍යයට ලම්භකයක් නිර්මාණය කරන්න.

(iii) රූපයේ දක්වා ඇති සිලින්ඩරයේ නිවැරදි මිනුම් අනුව විකසන චිත්‍රය ඇඳ දක්වන්න.




[හත්වැනි පිටුව බලන්න.

**3.** ආකර්ෂණීය ලෙස නිම කරන ලද විසිතුරු භාණ්ඩ වර්තමාන වෙළෙඳපොළෙහි දක්නට ඇත.

(i) ගෘහ අලංකරණ ලෙස රිබන් එම්බ්‍රොයිඩර් ක්‍රමය භාවිතයේ දී යෙදෙන මැහුම් ක්‍රම **දෙකක්** ලියන්න.

(ii) කෘත්‍රිම ආභරණ නිර්මාණය සඳහා පාන්ක්ලේ මිශ්‍රණය සකස් කර ගන්නා ආකාරය දක්වා කෘමි උවදුරු වැළැක්වීම සඳහා යොදන ආරක්ෂිත ක්‍රමවේදයක් දක්වන්න.

(iii) තාප බන්ධිත ක්‍රමයට ඔබගේ පාසල් පොත් බෑගය අලංකාර කර ගැනීමට සුදුසු චිත්‍රයක් අඳින්න. එම ක්‍රමයට එය නිර්මාණය කර ගන්නා ආකාරය කෙටියෙන් දක්වන්න.

**4.** බඳුන් පලස් (Table mat) හැදයක් සකස් කර ගැනීමට අවශය නූල් හැදයක විස්තර පහත දැක්වේ.

- ✻ හැදයේ දිග මීටර් 50 කි.
- ✻ හැදයේ පළල සෙන්ටිමීටර් 20 කි.
- ✻ එක් සෙන්ටිමීටරයකට යොදන දික් නූල් ගණන 40 කි.
- ✻ දික් නූලේ අංකය $2^S$ / 40 ක් වේ.

(i) බඳුන් පලස් විවීමට සුදුසු වියමන් රටා **දෙකක්** නම් කරන්න.

(ii) ඉහත (i) හි ඔබ නම් කළ වියමන් රටා දෙකෙහි නූල් මතුවීම් ප්‍රස්ථාරගත කර ඒවා නම් කරන්න.

(iii) බඳුන් පලස් හැදය විවීමට අවශ්‍ය දික් නූල්වල බර ප්‍රමාණය ගණනය කරන්න.

**5.** වර්තමානයේ රෙදි පිළි අලංකරණය සඳහා විවිධ අලංකරණ ක්‍රම භාවිත කෙරේ.

(i) අතින් පින්තාරු කිරීමේ දී දම් පැහැය ලබා ගැනීම සඳහා මිශ්‍ර කළ යුතු මූලික වර්ණ මොනවා ද?

(ii) මුද්‍රණය කළ රෙදිවල සායම් ස්ථිර කිරීම සඳහා කරනු ලබන පසුපිරියම් ක්‍රම **දෙකක්** සඳහන් කර එයින් **එකක්** පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

(iii) බතික් නිර්මාණයකට සුදුසු චිත්‍රයක් ඇඳ එය **එක්** වර්ණයක් භාවිතයෙන් අලංකරණය කරන ආකාරය විස්තර කරන්න.

**6.** ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ම මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා උත්සාහ කර ඇති බව පැහැදිලිව දක්නට ඇත.

(i) මැටි නිර්මාණය වීම සඳහා බලපාන හේතු සාධක **දෙකක්** සඳහන් කරන්න.

(ii) මැටි පදම් කර ගන්නා ප්‍රධාන ක්‍රම **දෙක** සඳහන් කර ඉන් **එක** ක්‍රමයක් පැහැදිලි කරන්න.

(iii) මැටි තහඩු භාවිතයෙන් මල් බඳුනක් සකස් කර ගන්නා ආකාරය පියවර අනුව විස්තර කරන්න.

**7.** අප ජීවත්වන පරිසරය අලංකරණය කිරීම සඳහා විවිධ ක්‍රම භාවිත කෙරේ.

(i) උද්‍යාන අලංකරණ නිර්මාණ ශිල්පීය ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(ii) කඩදාසි ආශ්‍රිත මැටි භාණ්ඩ අලංකාර කිරීමේ ක්‍රම **දෙකක්** දක්වා එයින් **එකක්** විස්තර කරන්න.

(iii) නිවසක අභ්‍යන්තරය අලංකරණයට සුදුසු මූර්තියක් සඳහා මාධ්‍යයක් නම් කර එම මූර්තිය නිර්මාණය කර ගන්නා ආකාරය විස්තර කරන්න.

✻ ✻ ✻

සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

# 84 - ශිල්ප කලා

### ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023(2024)

## 84 - ශිල්ප කලා

### ලකුණු දීමේ පටිපාටිය

ලකුණු බෙදී යාම

**I පත්‍රය = 40**

**II පත්‍රය = 20 + (10 X 4) = 60**

**මුළු ලකුණු 40 + 60 = 100**

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023(2024)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..................................................... √ △ $\frac{4}{5}$

(ii) ..................................................... √ △ $\frac{3}{5}$

(iii) ..................................................... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.** අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු අදාළ තීරුවේ ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස I වන පත්‍රය II වන පත්‍රය හෝ III වන පත්‍රය තීරුවේ ඇතුළත් කළ යුතු ය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023(2024)

## 84 - ශිල්ප කලා

## ලකුණු දීමේ පටිපාටිය

**එක් එක් ප්‍රශ්න පත්‍රයේ ලකුණු බෙදී යාම පිළිබඳ සාරාංශය**

**I පත්‍රය :** මෙය බහුවරණ ප්‍රශ්න හතළිහකින් යුක්තය. එක් නිවැරදි පිළිතුරකට එක ලකුණ බැගින් ප්‍රදානය කෙරේ. මුළු ලකුණු ප්‍රමාණය 40 කි.

**II පත්‍රය :** ප්‍රශ්න හතරකින් යුක්තය. ප්‍රශ්න අංක එක අනිවාර්ය වේ. එහි ඇති කොටස් දහය සඳහාම පිළිතුරු දීම අපේක්ෂිතය. එක් නිවැරදි පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු විස්සකි. මෙම ප්‍රශ්නය සම්පූර්ණ විෂය නිර්දේශයම ආවරණය වන ආකාරයට සැකසී ඇත.

ඉතිරි ප්‍රශ්න 06 අතරින් තෝරාගත් ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ. එක් පිළිතුරකට ලකුණු 10 ක් ප්‍රදානය කෙරේ. සෑම ප්‍රශ්නයක්ම කොටස් 03 කින් යුක්ත වන අතර කොටස් තුනට බර තබා ඇත්තේ ක්‍රමයෙන් ගැඹුරු වන ආකාරයට වේ. තෝරාගත් ප්‍රශ්න හතර සඳහා හිමිවන ලකුණු ප්‍රමාණය (10 x 4) හතළිහකි. මේ අනුව II පත්‍රය සඳහා මුළු ලකුණු ප්‍රමාණය 20 + (10 x 4) = 60 කි.

(II ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු සැපයීමේ දී පළමු ප්‍රශ්නය හා තෝරාගත් ප්‍රශ්න 04 සමග ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ.)

සම්පූර්ණ ප්‍රශ්න පත්‍රය සඳහා
I පත්‍රය = 40
II පත්‍රය = 20 + (10 x 4) = 60
මුළු ලකුණු 40 + 60 = 100 කි

## අවසාන ලකුණු ගණනය කිරීම සඳහා උපදෙස්

- ලකුණු ප්‍රදානය කිරීමේදී එක් එක් පිළිතුරු කොටස් සඳහා දකුණු පස තීරුවේ ලකුණු සටහන් කරන්න.

- සෑම ප්‍රශ්නයකම අවසානයේ පහතින් ලකුණු සටහන් කළ යුත්තේ ප්‍රශ්න අංකය ලියා ඒ ඉදිරියෙන් භාග සංඛ්‍යා සහිතව තිරස්ව සඳහන් කිරීමෙනි.

- දකුණු පස තීරුවේ යොදන ලකුණු සංඛ්‍යාව සහ භාග සංඛ්‍යා ලෙස තිරස්ව ලියන ලද ලකුණු සංඛ්‍යාව සමාන විය යුතු අතර සිරස් ලකුණු එකතුව සහ තිරස් ලකුණු එකතුව සමාන වීම අත්‍යවශ්‍ය බව සලකන්න.

- පළමු පිටුවට ලකුණු ගෙන ඒමේ දී ඇතුළු පිටුවල ලබා දී ඇති ලකුණු නිවැරදිව ඉදිරියට ගෙන ඇති අයි සමාන කර බලන්න. ඒ පිළිබඳ ඔබේ අවධානය දැඩි ලෙස යොමු කරන්න.

- අවසාන ලකුණු ගණනය කිරීමේ දී ඔබේ ගණිත පරීක්ෂකගේ සහය හොඳින් ලබා ගෙන ලකුණුවල නිරවද්‍යතාව ආරක්ෂා කර ගන්න.

## ලකුණු ලැයිස්තු පිළියෙල කිරීම සඳහා උපදෙස්

- ලකුණු ලැයිස්තුවේ සඳහන් අයදුම්කරුගේ විභාග අංකය සමග උත්තර පත්‍රයේ සඳහන් විභාග අංකය හොඳින් සසදා බලන්න. වෙනසක් දක්නට තිබේනම් ප්‍රධාන පරීක්ෂක වෙත වාර්තා කරන්න.

- පිළිතුරුපතට හිමි ලකුණු විස්තර ලකුණු ලැයිස්තුවට ගැනීමේ දී ප්‍රශ්න අංකයට නිවැරදිව ඇතුළත්කිරීම පිළිබඳ අවධානය යොදන්න.

- පැහැදිලි ලෙස ඉලක්කම් ලියන්න. ඉලක්කම් ලිවීමේ දී ලබා දී ඇති උපදෙස් පිළිපදින්න.

- වැරදීමක් සිදු වූ විට නැවත ඒ මත නොලියා එය තනි ඉරකින් කපා හැර ඒ ආසන්නයේම නැවත පැහැදිලිව ලියන්න. කෙටි අත්සන ද යොදන්න.

## I පත්‍රයේ අභිමතාර්ථ පිළිබඳ හැඳින්වීමක්

ශිල්ප කලා විෂයයේ I ප්‍රශ්න පත්‍රය ගොනුකර ඇත්තේ සමස්ථ විෂය ක්ෂේත්‍රයම ආවරණය කෙරෙමිනි. බහුවරණ ප්‍රශ්න 40 තුළින් සිසු දරුවන්ගේ න්‍යායික දැනුම පමණක් නොව ආකල්ප සහ කුසලතා පිළිබඳ ව ඇගයීම අපේක්ෂා කෙරේ.

කාර්මික ඇඳීම විෂය ක්ෂේත්‍රයේ එයට අදාල න්‍යායික දැනුම උපයෝගී කර ගනිමින් කෙරෙන නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඇගයීම සඳහා හොඳින් සංවිධානය කරන ලද ප්‍රශ්න සමූහය මගින් සිසුන්ගේ දැනුම, ආකල්ප සහ කුසලතාවන්ට අමතරව නිපුණතා පිළිබඳව අධීක්ෂණය කෙරේ. රෙදිපිළි අලංකරණ ක්‍රම, සම්ප්‍රදායික වියමන් රටා, විවීමේ මූලධර්ම, උත්සව අවස්ථා සඳහා නිර්මාණ, මැටි මාධ්‍ය නිර්මාණ, මැටි භාණ්ඩ අලංකරණය සහ උද්‍යාන අලංකරණය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාලව සිසුන්ගේ දැනුම් ආශ්‍රිත න්‍යායික අභ්‍යාස ආවේදන ආශ්‍රිතව ගොඩනැගෙන සංකල්පමය හැකියා සමග ක්‍රියාකාරකම් තුළින් මතුකෙරෙන කුසලතා පිළිබඳවත්, මේ සියල්ල තුළින් මතුවන නිපුනතා වන පිළිබඳ සමස්ත ඇගයීම I පත්‍රයේ අභිමතාර්ථ ලෙස දැක්විය හැකිය.

## I පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්

➤ **බහුවරණ පිළිතුරු පත්‍ර ලකුණු කිරීම සඳහා භාවිත කරන "කවුළු පත" සකස් කිරීමේ දී පහත සඳහන් උපදෙස් පිළි පදින්න.**

- ප්‍රශ්න අංක සටහන්කර ඇති තීරු, අංක පෙනෙන ලෙස සිරස් අතට කපා ඉවත් කරන්න.
- අවසාන අංක දහය දක්වා ඇති (අංක 30 - 40) තීරුවේ දකුණු කෙළවර හිස් කොටස සිරස් අතට කපා එම තීරුව හරි වැරදි ලකුණු යෙදීමට ඉඩ ගන්න.
- නිවැරදි පිළිතුරු ඇතුලත් අංක කපා ඉවත් කර, කවුළු නිවැරදිව සකසා ගන්න.
- වරණ එකකට වඩා පිළිතුරු වශයෙන් ලකුණුකර තිබේ නම් තනි ඉරකින් තිරස්ව කපා හරින්න.
- කිසිවක් ලකුණු කර නොමැති වරණ පේළි තිබේ නම් ඒවා ද තිරස් අතට තනි ඉරකින් කපන්න.

➤ **උත්තර පත්‍ර මත කවුළු පත නිවැරදිව අංක සිටින සේ තබා ගැනීමට සැලකිලිමත් වන්න.**

- සෑම නිවැරදි පිළිතුරකටම (✓) හරි ලකුණක් යොදන්න. මේ සඳහා රතු පැහැති පෑනක් භාවිතා කරන්න.
- සෑම වැරදි පිළිතුරකටම (×) වැරදි ලකුණක් යෙදීමට මතක තබා ගන්න.
- ප්‍රශ්න අංකයට දකුණු පසින් එම සලකුණු යෙදීම ඉතා වැදගත්ය.
- එක් එක් පේළියේ පහළ කෙළවරින් නිවැරදි පිළිතුරු සංඛ්‍යාව සටහන් කරන්න.

➤ **නිවැරදි පිළිතුරු සංඛ්‍යාව එනම් මුළු එකතුව නියමිත කොටුව තුළ පැහැදිලි ඉලක්කම්වලින් සටහන් කරන්න.**

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018 දෙසැම්බර්

## 84 - ශිල්ප කලා -

## ලකුණු දීමේ පටිපාටිය

**ප්‍රශ්න අංක 01**

| | | |
|---|---|---|
| I | ලකුණු - | 02 |
| II | ලකුණු - | 02 |
| III | ලකුණු - | 02 |
| IV | ලකුණු - | 02 |
| V | ලකුණු - | 02 |
| VI | ලකුණු - | 02 |
| VII | ලකුණු - | 02 |
| VIII | ලකුණු - | 02 |
| IX | ලකුණු - | 02 |
| X | ලකුණු - | 02 |
| | මුළු ලකුණු | 20 |

**ප්‍රශ්න අංක 02**

| | | |
|---|---|---|
| I | ලකුණු - | 02 |
| II | ලකුණු - | 04 |
| III | ලකුණු - | 04 |
| | මුළු ලකුණු | 10 |

**ප්‍රශ්න අංක 03**

| | | |
|---|---|---|
| I | ලකුණු - | 02 |
| II | ලකුණු - | 04 |
| III | ලකුණු - | 04 |
| | මුළු ලකුණු | 10 |

**ප්‍රශ්න අංක 04**

| | | |
|---|---|---|
| I කොටස | ලකුණු - | 02 |
| II කොටස | ලකුණු - | 04 |
| III කොටස | ලකුණු - | 04 |
| | මුළු ලකුණු | 10 |

**ප්‍රශ්න අංක 05**

| | | |
|---|---|---|
| I කොටස | ලකුණු - | 02 |
| II කොටස | ලකුණු - | 03 |
| III කොටස | ලකුණු - | 05 |
| | මුළු ලකුණු | 10 |

**ප්‍රශ්න අංක 06**

| | | |
|---|---|---|
| I කොටස | ලකුණු - | 02 |
| II කොටස | ලකුණු - | 04 |
| III කොටස | ලකුණු - | 04 |
| | මුළු ලකුණු | 10 |

**ප්‍රශ්න අංක 07**

| | | |
|---|---|---|
| I කොටස | ලකුණු - | 02 |
| II කොටස | ලකුණු - | 04 |
| III කොටස | ලකුණු - | 04 |
| | මුළු ලකුණු | 10 |

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்
## අ.පො.ස. (සා.පෙළ) විභාගය 2023(2024)
## க.பொ.த (சா.தர)ப் பரீட்சை – 2023(2024)

| විෂයය අංකය<br>பாட இலக்கம் | 84 | විෂයය<br>பாடம் | ශිල්පකලා |
|---|---|---|---|

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 02 | 11. | 03 | 21. | 02 | 31. | 03 |
| 02. | 01 | 12. | 02 | 22. | 04 | 32. | 01 |
| 03. | 03 | 13. | 03 | 23. | 03 | 33. | 02 |
| 04. | 02 | 14. | 02 | 24. | 01 | 34. | 04 |
| 05. | 04 | 15. | 03 | 25. | 04 | 35. | 03 |
| 06. | 01 | 16. | 01 | 26. | 03 | 36. | 01 |
| 07. | 03 | 17. | 03 | 27. | 01 | 37. | 03 |
| 08. | 02,03 | 18. | 02 | 28. | 02 | 38. | 04 |
| 09. | 04 | 19. | 03 | 29. | 04 | 39. | 02 |
| 10. | 03 | 20. | 04 | 30. | 01 | 40. | 02 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25/40 | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25/40 |
|---|---|---|---|

## II පත්‍රයේ අභිමතාර්ථ පිළිබඳ හැඳින්වීමක්

සමස්ත විෂය නිර්දේශයම ආවරණය කෙරෙමින් ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත. කුසලතා මූලික කොටගත් ක්‍රියාකාරකම් තුළින් පූර්ණ පුද්ගලයකු බිහි කරවීමේ සංකල්පය ක්‍රියාත්මක කෙරෙන අතර දැනුම පාදක කෙරෙමින් ඇති කරන ආකල්ප සහ කුසලතා වර්ධනය තුළින් නිපුණතා වෙතට ගමන් කරන සිසුවාගේ ප්‍රාගුණ්‍යය කන්සේරු කරමින් ඇගයීමට ලක්කිරීම, ප්‍රමුඛතම අභිමතාර්ථය වෙයි.

ජ්‍යාමිතික ඇඳීම විෂය ක්ෂෙත්‍රය පිළිබඳ න්‍යායික දැනුම සමග නිර්මාණාත්මක ක්‍රියාකාරකම් තුළින් ගොඩනැගෙන නිපුණතා හඳුනාගැනීමේ අපේක්ෂාවෙන් II පත්‍රයේ ප්‍රශ්න රාශියක් ඉදිරිපත්කර ඇති ශ්‍රී ලංකාවේ ජනකලා රෙදිපිළි අලංකරණ ක්‍රම, වියමන් ආශ්‍රිත ක්‍රියාකාරකම්, ගෙතීමේ කුසලතා, විවීම පිළිබඳ මූලික සිද්ධාන්ත පදනම් කරගත් කණ්ඩායම්, ක්‍රියාකාරකම් මැටි මාධ්‍යයෙන් සිදුකෙරෙන නිර්මාණ, මැටි බඳුන් අලංකරණ විධි ක්‍රම සහ සිමෙන්ති මාධ්‍ය උපයෝගි කෙරෙමින් සිදුකෙරෙන නිර්මාණ ඇතුළත් විෂය ක්ෂෙත්‍රයන් හරහා සිසුන් ලබාගන්නා හැකියා නොහැකියා ඇගයීමත් ඔවුන්ගේ නිර්මාණශීලී චින්තනය අවධි කරවන සුළු න්‍යායික හා ප්‍රායෝගික කුසලතා සහ ඒ තුළින් ගොඩ නැගෙන නිපුණතා පැහැදිලිව හඳුනා ගැනීමේ අවස්ථාව උදාකර ගැනීම සුවිශේෂී අභිමතාර්ථයයි.

## II පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්

- ලකුණු දීමේ පටිපාටිය හොඳින් කියවා තහවුරු කරගන්න.
- උත්තර පත්‍ර ලකුණු කිරීම සඳහා රතු තීන්ත යොදන ලද පෑනක් (බෝල් පොයින්ට්) භාවිත කරන්න.
- පිළිතුරුපත් කියවීමේ දී සෑම පිළිතුරකම නිවැරදි කරුණු ඉදිරිපත්කර ඇති ස්ථානයක දී එම ස්ථානයේ (✓) හරි ලකුණක් යොදන්න. වැරදි පිළිතුරු සඳහා වැරදි (×) ලකුණු යොදා එම පිළිතුර වැරදි බව පෙන්වන්න.
- ප්‍රශ්න පත්‍රයේ උපදෙස් දී ඇති පරිදි ඒ ඒ කොටස් වලින් නියමිත පරිදි, ප්‍රශ්න තෝරාගෙන ඇත්දැයි විමසිලිමත් වන්න.
- අනිවාර්ය ප්‍රශ්නය වූ පළමුවැනි ප්‍රශ්නයත්, තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයා තිබේදැයි සැළකිල්ලෙන් බලන්න.
- ඒ ඒ ප්‍රශ්නයේ කොටස්වලට හිමිවිය යුතු ලකුණු නිවැරදිව ලබා දී දකුණු පැත්තේ සටහන් කිරීමට සහ නිවැරැදිව ලකුණු එකතු කිරීම පිළිබඳව වැඩි අවධානයක් යොදන්න.

අ.පො.ස(සා.පෙළ) විභාගය 2023(2024)

84 ශිල්ප කලා II

**II පත්‍රයේ I වන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය තුළින් ශිල්ප කලා විෂය ධාරාවට අයත් සියලු නිපුණතාවයන්හි න්‍යායාත්මක හා ප්‍රායෝගික ක්‍රියාවලින් ඇගයීමට ලක්වන සේ ප්‍රශ්න කොටස් ඉදිරිපත් කරනු ලැබේ.**

1. ඔබ පාසලේ මෙවර පැවැත්වෙන නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවයේ විසිතුරු කිරීමේ අවස්ථා සියල්ල ශිල්ප කලා අංශයේ සිසුනට පැවරීමට ක්‍රීඩා කමිටුව තීරණය කර ඇත.
   (i) ක්‍රීඩා උත්සවය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමට සුදුසු පෝස්ටරයක ආකෘතියක් ඇඳ දක්වන්න.
   (ii) ආරාධිතයන් සඳහා යැවීමට ආරාධනා පත්‍රයක මුහුණතකට සුදුසු චිත්‍රයක් ඇඳ දක්වන්න.
   (iii) වියමන් රටා ඇසුරින් නිවාස නාම සකස් කිරීමට යොදා ගත හැකි පන් වර්ග **දෙකක්** නම් කරන්න.
   (iv) සමාරම්භක උළෙලේ නිවාස පුවරු රැගෙන යන ශිෂ්‍යයින්ගේ ඇඳුම් අලංකාර කිරීම සඳහා අච්චු මුද්‍රණ ක්‍රමයෙන් සකස් කර ගත හැකි මෝස්තරයක් චිත්‍රණය කර දක්වන්න.
   (v) 'පරවි' නිවාසයේ සිසුන් හඳුනා ගැනීම සඳහා පැළඳීමට සුදුසු ලාංඡනයක රූප සටහනක් ඇඳ දක්වන්න.
   (vi) සහතික පිරිනමන අවස්ථාවේ ක්‍රීඩකයින්ට දීමට යොදා ගන්නා, කෘත්‍රිම මල් සැකසුම් භාවිතයේ වාසි **දෙකක්** සඳහන් කරන්න.
   (vii) විවේක කාලයේ දී නිවාස සාමාජිකයින්ට ලබා දෙන කෙටි ආහාරය අසුරාලීමට සුදුසු ඇසුරුමක රූපීය පෙනුම් ඇඳ දක්වන්න.
   (viii) තූර්ය වාදක කණ්ඩායමේ සාමාජිකයින්ට ගෙළ පැළඳීම සඳහා ආභරණ සැකසීමට යොදා ගත හැකි ස්වභාවික ඇට වර්ග **දෙකක්** ලියන්න.
   (ix) නිවාස ධජයක් ඩිජිටල් මුද්‍රණය සඳහා රුපියල් අටසියයක් වැය වන අතර ධජ පහක් මුද්‍රණයේ දී 20% ක වට්ටමක් හිමි වේ. නිවාස ධජ පහ මුද්‍රණයට වැය වන මුදල ගණනය කරන්න.
   (x) දක්ෂතම ක්‍රීඩකයින්ට/ක්‍රීඩිකාවන්ට පිරිනමන කුසලානය සඳහා සුදුසු ආකෘතියක් චිත්‍රණය කර දක්වන්න.

1. (i) තේමවට ගැලපෙන පෝස්ටරයක්, දිනය,වේලාව,ස්ථානය සඳහන් කර ඇඳ තිබීම.

**(ලකුණු 02)**

(ii) තේමාවට ගැලපෙන ආරාධනා පත්‍රයක මුහුණතට ගැලපෙන චිත්‍රයක් ඇඳ තිබීම

**(ලකුණු 02)**

(iii) ගල්ලැහැ
වැටකෙයියා
දුනුකෙයියා
තුන්හිරියා
ගොක් කොළ
පොල් කොළ
ඉදි කොළ
තල් කොළ
ආදී පන් වර්ග දෙකක් නම් කිරීමට

**(ලකුණු 02)**

(iv) අච්චු මුද්‍රණයක් සඳහා කපාගත හැකි මෝස්තරයක් ඇඳ දැක්වීම **(ලකුණු 02)**

(v) පරවියාගේ සංකේතය හෝ නාමය ඇසුරින් ලාංඡනයක් ඇඳ දැක්වීම

**(ලකුණු 02)**

(vi) භාවිතයට පහසු වීම

ප්‍රවාහනයට පහසු වීම

නැවත නැවත භාවිතා කිරීමට හැකි වීම

සෑම ප්‍රදේශයකින්ම මිලදී ගත හැකි වීම

තැලීම් පොඩිවීම් වලට ඔරොත්තු දීම

අවශ්‍ය වර්ණවලින් ලබා ගත හැකි වීම

කරුණු දෙකක් ලියා දැක්වීම

**(ලකුණු 02)**

(vii) ආහාර ඇසීරීමට සුදුසු රූපීය පෙන්නුමක් ඇඳ තිබීමට (භාණ්ඩයේ සාමාන්‍ය හැඩය)

**(ලකුණු 02)**

(viii) රබර් ඇට

දොඹ ඇට

මදටිය ඇට

ඔළිඳ ඇට

කී කිරිදිය ඇට

පුස් ඇට

සියඹලා ඇට

ඉපිල් ඉපිල් ඇට

වැනි ස්වාභාවික ඇටවර්ග දෙකක් නම් කර තිබීමට

**දෙකක් නම් කිරීමට (ලකුණු 02)**

(ix) 800 x 5 -4000

$4000 \times \frac{20}{100} = 800$

4000-800=3200

රු.3200.00

පිහිටුවීමට ලකුණු 01 නිවැරදි පිළිතුරට ලකුණු 01

**(ලකුණු 02)**


(x) කුසලානයකට ගැලපෙන චිත්‍රයක් ඇඳ දැක්වීමට

**(ලකුණු 02)**


**(මුළු ලකුණු 20)**

2. **මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමෙන් නිෂ්පාදන ක්‍රියාවලියේදී සැලසුම් චිත්‍ර ඇඳීමට භාවිතා කරන විශ්වීය භාෂාවක් වන ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීමේ මූලධර්මයන් ප්‍රායෝගිකව හා න්‍යායාත්මකව භාවිතා කිරීමේ හැකියාව ඇගයීමට ලක්කිරීමයි.**

2. භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේ දී සැලසුම් චිත්‍ර නිර්මාණයට ජ්‍යාමිතිය හා යාන්ත්‍රික ඇඳීම භාවිතයට ගනු ලබයි.
   (i) කවකටුව හා කෝදුව භාවිතයෙන් පාදයක් 4 cm වූ ABC සමපාද ත්‍රිකෝණය නිර්මාණය කරන්න.
   (ii) 7 cm වූ AB රේඛාව ඇඳ A සිට 4 cm ක් දුරින් පිහිටි ලක්ෂ්‍යයට ලම්භකයක් නිර්මාණය කරන්න.
   (iii) රූපයේ දක්වා ඇති සිලින්ඩරයේ නිවැරදි මිනුම් අනුව විකසන චිත්‍රය ඇඳ දක්වන්න.





2. (i)




**නිවැරදිව ඇඳීමට**

**(ලකුණු 02)**

(ii)





**7 Cm රේඛාව ඇඳීමට (ලකුණු 01)**

**4 Cm ලක්ෂය ලකුණු කිරීමට (ලකුණු 01)**

**ලම්භකය නිර්මාණයට (ලකුණු 02)**

(iii)



විකසන චිත්‍රය නිවැරදි මිනුම් අනුව ඇඳ දැක්වීමට

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

3. අභිමතාර්ථ

**විසිතුරු භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේදී අලංකරණය කිරීම සඳහා යොදාගන්නා විසිතුරු මැනුම් ක්‍රම, විවිධ මිශ්‍රන සකස් කිරීමේ ක්‍රම ශිල්ප පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම මැන බැලීම මින් අපේක්ෂා කෙරේ.**

3. ආකර්ෂණීය ලෙස නිම කරන ලද විසිතුරු භාණ්ඩ වර්තමාන වෙළෙඳපොළෙහි දක්නට ඇත.

(i) ගෘහ අලංකරණ ලෙස රිබන් එම්බ්‍රොයිඩර් ක්‍රමය භාවිතයේ දී යෙදෙන මැහුම් ක්‍රම **දෙකක්** ලියන්න.

(ii) කෘත්‍රිම ආභරණ නිර්මාණය සඳහා පාන්ක්ලේ මිශ්‍රණය සකස් කර ගන්නා ආකාරය දක්වා කෘමි උවදුරු වැළැක්වීම සඳහා යොදන ආරක්ෂිත ක්‍රමවේදයක් දක්වන්න.

(iii) තාප බන්ධිත ක්‍රමයට ඔබගේ පාසල් පොත් බෑගය අලංකාර කර ගැනීමට සුදුසු චිත්‍රයක් අඳින්න. එම ක්‍රමයට එය නිර්මාණය කර ගන්නා ආකාරය කෙටියෙන් දක්වන්න.

3. (i) රිබන් මැස්ම

කෙලින් මැස්ම

ලේසි ඩේසි මැස්ම

නැටි මැස්ම

ලූප් මැස්ම

ප්‍රංශ ගැට මැස්ම **(මින් ඕනෑම 02 ක් නම් කිරීමට ලකුණු 02)**

(ii) අවශ්‍ය ද්‍රව්‍ය

දිනක් පරණ පාන්

බයින්ඩර ගම්

කපුරු කුඩු

වර්ණක **(ලකුණු 02)**

දිනක් පරණ පාන් වල මැද කොටස ගෙන කොටස් වලට කඩා බයින්ඩර් ගම් මිශ්‍ර කර අනාගන්න.

පදම් වූ පසු කැමති හැඩයන් සකස් කර ගන්න.

අවශ්‍ය නම් වර්ණ ගන්වන්න.

කල් තබා ගැනීමට කපුරු කුඩු හෝ පල්මානික්කම් එකතු කරන්න.

හොඳින් වියළා ගන්න.

**(ලකුණු 02)**

(iii) පොත් බෑගයකට සුදුසු මෝස්තර ඇඳීම. **(ලකුණු 02)**

රෙදි කැබැල්ල පෙර පිරියම් කර හොඳින් මදින්න.

අවශ්‍ය මෝස්තරය මුද්‍රිත රෙදි කැබැල්ලකින් කපා ගන්න.

එය තාප බන්දිත කඩදාසි මත රෙදි කැබැල්ල තබා උණුසුම් ස්ත්‍රික්කයෙන් මදින්න.

එම කඩදාසියේ පිටු පසු කඩදාසි තිරුව ගලවා ඉවත් කරන්න.අනවශ්‍යකඩදාසි කොටස් කපා ඉවත් කරන්න.

එම කඩදාසි සහිත මෝස්තර කොටස බෑගයේ අවශ්‍ය තැනට තබා නැවත ස්ත්‍රික්ක කරන්න.

අවුට් ලයිට් භාවිතයෙන් නිමහම් කරන්න. **(ලකුණු 02)**

**මුළු ලකුණු** 10

**4. මෙම ප්‍රශ්නය මගින් රෙදිපිළි නිෂ්පාදනයේදී යොදාගන්නා වියමන් රටා හඳුනා ගැනීම,රෙදිපිළි නිශ්පාදනයේ දී පිරිවැය ගණනය කිරීම,වියමන් රටා ප්‍රස්තාරගත කිරීම පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම, ආකල් හා කුසලතා ඇගයීම අපේක්ෂා කෙරේ.**

4. බඳුන් පලස් (Table mat) හැදයක් සකස් කර ගැනීමට අවශය නූල් හැදයක විස්තර පහත දැක්වේ.

- ✻ හැදයේ දිග මීටර් 50 කි.
- ✻ හැදයේ පළල සෙන්ටිමීටර් 20 කි.
- ✻ එක් සෙන්ටිමීටරයකට යොදන දික් නූල් ගණන 40 කි.
- ✻ දික් නූලේ අංකය $2^S / 40$ ක් වේ.

(i) බඳුන් පලස් විවීමට සුදුසු වියමන් රටා දෙකක් නම් කරන්න.

(ii) ඉහත (i) හි ඔබ නම් කළ වියමන් රටා දෙකෙහි නූල් මතුවීම ප්‍රස්ථාරගත කර ඒවා නම් කරන්න.

(iii) බඳුන් පලස් හැදය විවීමට අවශ්‍ය දික් නූල්වල බර ප්‍රමාණය ගණනය කරන්න.

4. (i) චාම් වියමන

ජටා වියමන

දික් දාර වියමන

හරස් දාර වියමන

සරලහිරි වියමන වැනි වියමන් රටා දෙකක් නම් කිරීමට

**රටා දෙකක් නම් කිරීමට** **(ලකුණු 02)**

(ii) නූල් මතු වීම ප්‍රස්තාර ගත කිරීමට **(ලකුණු 02)**

ඒවා නිවැරදිව නම් කිරීමට **(ලකුණු 02)**

(iii) කිලෝ ග්‍රෑම් වලින්

$$\frac{50 \times 20 \times 40 \times 2}{1000 \times 60} = 02 \text{ kg}$$

නූල් කැරලි ප්‍රමාණය

$$\frac{50 \times 20 \times 40}{1000} = \text{කැරලි } 40$$

නිවැරදිව සූත්‍රය පිහිටුවීමට **(ලකුණු 02)**

පිළිතුර නිවැරදිව ලබා ගැනීමට **(ලකුණු 02)**

**(මුළු ලකුණු 10)**

**5. රෙදිපිළි නිෂ්පාදනයේදී යොදා ගන්නා යන්ත්‍ර හා උපාංගයන්හි කාර්යය හඳුනා ගැනීමත්,පිළි අලංකරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුම ආකල්ප,කුසලතා න්‍යායාත්මක හා ප්‍රායෝගිකව ඇගයීම මෙමගින් අපේක්ෂිතය.**

**5.** වර්තමානයේ රෙදි පිළි අලංකරණය සඳහා විවිධ අලංකරණ ක්‍රම භාවිත කෙරේ.

(i) අතින් පින්තාරු කිරීමේ දී දම් පැහැය ලබා ගැනීම සඳහා මිශ්‍ර කළ යුතු මූලික වර්ණ මොනවා ද?

(ii) මුද්‍රණය කළ රෙදිවල සායම් ස්ථිර කිරීම සඳහා කරනු ලබන පසුපිරියම් ක්‍රම **දෙකක්** සඳහන් කර එයින් **එකක්** පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

(iii) බතික් නිර්මාණයකට සුදුසු චිත්‍රයක් ඇඳ එය **එක්** වර්ණයක් භාවිතයෙන් අලංකරණය කරන ආකාරය විස්තර කරන්න.

5. (i) දම් පැහැයට නිල් සහ රතු එකතු විය යුතුය. **(ලකුණු 02)**

(ii) උණුසුම් ස්ත්‍රික්කයකින් මැදීම

හුමාලකරණය

අව්වේ වියළීම

පවනේ වියළීම

ක්‍රම දෙකක් ලිවීමට **(ලකුණු 02)**

එක් පිළිතුරක් කෙටියෙන් විස්තර කිරීමට **(ලකුණු 02)**

(iii) චිත්‍රයක් ඇඳීමට

මෝස්තරය ඉටි කර ගැනීම

සායම් බඳුන් සකස් කිරීම

රසායනික ද්‍රව්‍ය නම් කර මිශ්‍රණය සැකසීම

ඩයි කිරීම (සායම් යෙදීම)

ඉටි ඉවත් කර ගැනීම

මද පවනේ වියළීම  විස්තර කිරීමට **(ලකුණු 03)**

**මුළු ලකුණු 10**

6. **මෙම ප්‍රශ්නය මගින් මැටි නිර්මාණය වීම පදම් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රායෝගික දැනුම මැන බැලීම අපේක්ෂා කෙරේ.**

**6.** ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ම මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා උත්සාහ කර ඇති බව පැහැදිලිව දක්නට ඇත.

(i) මැටි නිර්මාණය වීම සඳහා බලපාන හේතු සාධක **දෙකක්** සඳහන් කරන්න.

(ii) මැටි පදම් කර ගන්නා ප්‍රධාන ක්‍රම **දෙක** සඳහන් කර ඉන් **එක** ක්‍රමයක් පැහැදිලි කරන්න.

(iii) මැටි තහඩු භාවිතයෙන් මල් බඳුනක් සකස් කර ගන්නා ආකාරය පියවර අනුව විස්තර කරන්න.

6. (i) සූර්ය තාපය

වර්ෂාව

විදුලි කෙටීම

ආර්ද්‍රතාව

හිම පතනය

ශාක හා සත්ත්ව ද්‍රව්‍යවල ක්‍රියාකාරිත්වය

ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය

ඉහත කරුණු වලින් ඕනෑම දෙකක් සඳහා **(ලකුණු 02)**

(ii) ග්‍රාමීය වශයෙන් මැටි පදම් කිරීම

මහා පරිමාණ වශයෙන් මැටි පදම් කිරීම **(ලකුණු 02)**

ග්‍රාමීය ක්‍රමය

පාද හෝ දෑත් භාවිත කර පදම් කිරීම **(ලකුණු 02)**

මහා පරිමාණ ක්‍රමය

යන්ත්‍ර සූත්‍ර භාවිත කර ඇලෙනසුලු හා නොඇලෙනසුලු අමුද්‍රව්‍ය එකතුකර මැටි පදම් කිරීම.

**(ලකුණු 02)**

(iii) සමාන ඝනකමකින් මැටි තහඩුව සකස් කර ගැනීම

මැටි තහඩුවෙන් භාණ්ඩයට අවශ්‍ය පරිදි කොටස් කපා ගැනීම

කඩතොලු කර මැටි පාප්ප මගින් මැටි තහඩු කොටස් අලවා ගැනිම.

භාණ්ඩ සකස් කල පසු අනවශ්‍ය කොටස් කපා ඉවත් කිරීම.

මෝසතර යොදා භාණ්ඩය විසිතුරු කිරීම.

**(ලකුණු 04)**

**මුළු ලකුණු** 10

**7. මෙම ප්‍රශ්නය මගින් උද්‍යාන අලංකරණ ක්‍රියාවලියේ යොදා ගන්නා මාධ්‍ය ,ක්‍රම ශිල්ප හා අලංකරණ ක්‍රියාවලිය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම,කුසලතා,ආකල්ප මැන බැලීම අපේක්ෂා කෙරේ.**

7. අප ජීවත්වන පරිසරය අලංකරණය කිරීම සඳහා විවිධ ක්‍රම භාවිත කෙරේ.
   (i) උද්‍යාන අලංකරණ නිර්මාණ ශිල්පීය ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.
   (ii) කඩදාසි ආශ්‍රිත මැටි භාණ්ඩ අලංකාර කිරීමේ ක්‍රම **දෙකක්** දක්වා එයින් **එකක්** විස්තර කරන්න.
   (iii) නිවසක අභ්‍යන්තරය අලංකරණයට සුදුසු මූර්තියක් සඳහා මාධ්‍යයක් නම් කර එම මූර්තිය නිර්මාණය ක ගන්නා ආකාරය විස්තර කරන්න.

7. (i) පූර්ණ උන්නක

අර්ධ උන්නක

අල්ප උන්නක

**මින් දෙකක් නම් කර තිබීම** **(ලකුණු 02)**

(ii) කොලාජ් ක්‍රමය

ඩෙකොපාජ් ක්‍රමය

පල්ප ක්‍රමය

**මින් දෙකක් නම් කර තිබීම** **(ලකුණු 02)**

**එකක් විස්තර කර තිබීම** **(ලකුණු 02)**

(iii) මාධ්‍ය - මැටි,පල්ප, ප්ලාස්ටර්ඔෆ් පැරිස් ලෝහ, දැව,සිමෙන්ති

මින් එකක් නම් කිරීමට **(ලකුණු 01)**

**එය විස්තර කර තිබීම** **(ලකුණු 03)**